# සිංහල ජනකවියෙන් පිළිඹිඹු වන ගැමි ජීවිතය

නාවලපිටියේ ධම්මරතන හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

කවියටත් කලාවටත් සිංහලයා තුළ තිබූ ලැදිකම ඈත අතීතයේ සිටම එන්නකි. අනුරාධපුර, පොළොන්නරු ආදී යුගවලදී සිංහලයන් වෙත තිබූ සාහිත්‍ය රුචිය මහනුවර යුගය වන විට කෙමෙන් වෙනස් වී ගියද ඔවුන් තුළ කවියට තිබූ කැමැත්ත එලෙසම තිබෙන්නට විය. විසි අවුරුද්දක් ලංකාවේ ජීවත් වුණු රොබට් නොක්ස් ලංකාවේ කවි පිළිබඳ විස්තරයක් සපයමින් මෙසේ අදහස් දක්වයි. " සෑම සිංහලයෙකුම තරමක කවියෙකි. ඔවුන්ට කවිය නිර්මාණය කළ හැකිය. සිංහලයාගේ කවියට තිබූ කැමැත්ත පිළිබඳව ඉහත දක්වන ලද ප්‍රකාශනයෙහි සත්‍යතාව දැනට ඉතිරි වී ඇති ජනකවි සමූහයෙන් මනාව ඔප්පු වේ.

ජනකවිවල උප්පත්තිය සෙවීම කෙසේවත් කළ නොහැකි බැව් පෙනේ. පහත පෙනෙන කව එවැනි වෑයමක යෙදෙන වුන් සරදමකට ලක් කරන්නක් බඳුය.

අහස උපන් තැන සකි නුඹ දන්නවද
පොළොව උපන් තැන සකි නුඹ දන්නවද
මුහුද උපන් තැන සකි නුඹ දන්නවද
සිවු පද උපන් තැන සකි නුඹ දන්නවද?

ජන කවිවල භාෂා විලාසය අනුව ඒවායේ පැරණි බව පිළිබඳව නිගමනයකට බැසීම පහසු මගක් සේ ඇතැම් විට පෙනෙතත් එය එතරම් ශාස්ත්‍රීය ක්‍රමයක් ලෙස හැඳින්විය නොහැක. ජන කවි වරින් වර වෙනස් වෙමින් නව මුහුණු වරක් ගත් බව මේ පිළිබඳ සොයා බලන විට අපට පෙනෙන කරුණකි. සමහර කවීන් විසින් නිර්මාණය කළ ඇතැම් කවි ගැමියන් විසින් තමන්ට තේරෙන භාෂාවෙන් සාදා ගැනීම නිසා එම කවිවල අර්ථයද වෙනස් වී ඇති බව පෙනේ. මේ අනුව දැනට ඉතිරි වී ඇති ජන කවිවල මුල් ස්වරූපය බොහෝ සෙයින් වෙනස් ආකාරයකින් තිබෙන්නට ඇතැයි සිතන්නට පුලුවන.

පරම්පරා ගණනක් කටින් කට පැමිණි මෙම ජන කවිවලට අලුත් අදහස් එකතු වීමද ස්වාභාවික කරුණකි. මෙවැනි වෙනස් වීම් වලට භාජනය නොවන්නට ඇත්තේ ලේඛනාරූඪ කරන ලද කවි පමණක් බව සිතීමට පුලුවන. ජනකවිය උසස් පහත් හෝ භේදයක් නොවූ බවත් එය රදළයාට මෙන්ම සිඟන්නාටද එකසේ හිමිකම් කිව හැකි වස්තුවක්ව පැවති බවක් පහත සදහන් කවියෙන් කියැවේ.

කරුණාවන්ත පින්වත් මහතුනේ මට
හැදුණා අංස භාගේ පුරුවෙ ප වට
දැනෙනා තරම් පිළියම් කළ මුත් ඊට
මැරෙණ තුරා අත් විය හිඟමන මෙ මට

මෙය නූතන ලෝකයේ සිඟන්නෙකු ගේ මුවින් පිටවන කවියකි. පැරණි සිංලයාගේ නොයෙක් දේ පිළිබද විමසීමේදී අපට වැඩි පිහිටක් ලැබෙන්නේ පඩිවරුන් අතරින් බිහිවී ශ්‍රේෂ්ඨ සිංහල කාව්‍ය නමින් බුහුමන් ලැබූ කෘතිවලින් නොව පොදු ජනයා අතරින් පැන නැගී කටින් කට මේ දක්වා පැවත එන කවිවලිනි. සිංහල ගැමි ජීවිතය ගත් විට අපට දක්නට ලැබෙන්නේ ගැමි මිනිසුන් ගේ තමන් කරනා සෑම කාර්යයක් සමගම කවියක්ද බිහිවී ඇති බවයි. පාරම්පරික කර්මාන්ත පොදු ජන ඇදහිලි, විවාහ ජීවිතය, කුලභේදය, ආර්ථික, දුෂ්කරතා, ආදී සෑම දෙයකටම කවි බිහිවී ඇති බව පෙනේ. 'තවලම්' ද පෙරවූ එක්තරා වාහනයකි. බඩු බාහිරාදිය රැගෙන යෑම සඳහා භාවිතා කළ දෙයකි. මේ තවලම හා සම්බන්ධ කවි ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වී ඇති බව පෙනේ. තවලම හා සම්බන්ධ කවියක් ගෙන බලමු.

වැස්සක් වසින්නා වැසි කළු කර න්නා
ගොනා නොයන්නා ඉගෝතිය නෙමෙ න්නා
පතුල ලිෂාන්නා බඩු බිම ඇනෙ න්නා
මෙදා මගේ තවලම රිස්ස ය න්නා

කලාතුරකින් හමුවන තවලම් කවි, කරත්ත කවිවලට වඩා පැරණි යැයි ඇතැමුන් කිවද එය ශාස්ත්‍රීය නිගයමයක් නොවන්නේ, උඩරට කැතින් තැන තවමත් තවලම් ඇති නිසාය. ඉහත සඳහන් කවියෙන්ද පෙනී යන්නේ එදා තවලමද ජීවන වෘත්තියක් කරගත් අය සිටි බවට සාධකයක් ලෙසය.

නූතන මෙන්ම පැරණි ගැමි ජීවිතයේද ගොවිතැනට ලැබෙනුයේ ප්‍රධාන තැනකි. අද සමාජයේ නම් ගොවිතැනට නොයෙක් උපකරණ තිබේ. මෙතරම් දියුණු වී නොතිබුණු කලක් වූ එදා එම වැඩ කටයුතු කරගනු ලැබුයේ මිනිස් ශ්‍රමයෙනි. කිසියම් කරුණක් නිසා නැදෑ හිතමිතුරන්ගෙන් බලාපොරොත්තු වූ සහාය ලබාගන්නට නොහැකි වූ විට සිදුවන්නේ නොයෙක් අකරතැබ්බයන්ට මුහුණ පෑමටයි. එවැනි අවස්ථාවන්ට පත්වූවන්ගේ අදෝනාද ඇතැම් ජන කවිවලින් පෙනේ. පහත සඳහන් වන්නේ එවැනි කවියකි.

අදුරු ලලා සෙන්කඩගල වසි ත්තේ
පදුරු ලලා වල් කුඹු මැටි බඳි ත්තේ
අක්ක තගෝ නැති අරුමේ දැනෙ ත්තේ
මෙදා අද කුඹුර නෙළුමෙන් ඇරෙ ත්තේ

පාලුව තනිකම ආදී සැම දුකක් නැති කරගැනීම සඳහා කවි කී අයද සිටි අතර ජීවනෝපාය සඳහා කවි කී අයද සිටි බව පෙනේ. පහත සඳහන් වන්නේ එවැනි කවියකි.

එරත් තොසේම තොසේ කිය ස්සා
තලා කෝසේම කෝසෙ කිය ස්සා
මට දෙන තෑගි මම විමසා බල ස්සා
තෑගි දෙතොත් හොඳ සීපද කිය ස්සා

මේ කවේ අන්තිම පද දෙකේ තෑගි ලැබීම සඳහා ඔහු තුළ ඇති ආසාවද පෙන්වා දෙයි. ආර්ථික අතින් පහත මට්ටමක සිටි මහනුවර යුගයේ විසූ අය කවිය බඩ වඩා ගැනීමේ ක්‍රමයකට යොදා ගැනීම පුදුමයට කරුණක් නොවේ. මේ සැම දෙයකින්ම පැහැසිලි වන්නේ ගැමි ජීවිතයේ තිබූ දේවල්ය. හඩන බිළිඳෙකු නැලවීම පිණිස යොදාගෙන ඇත්තේද ජනකවි බව පෙනේ.

අතට වෙරලු ඇහිද ගෙනේ
ඉණට පළා නෙළා ගෙනේ
බරටම දර කඩා ගෙනේ
එයි අම්මා විගස කිනේ

ඉහත සඳහන් කළ කවිය තිඹිරි ගෙයක් තුළදී කියන කවියකි. කවිය අසන බිළිදා නිදා ගනී. ගැමියන්ගේ රැකියා අතර ගොනුගේ පිහිටෙන් දිවි ගෙවූ කරත්ත කරුගේ රැකියාවද තිබුණු බව පහත සඳහන් කවියෙන් පෙනේ.

තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්ක නවා
කටු කැළේ ගාල නොලියා වද දෙ නවා
හපුතලේ කන්ද දැකලා බඩ ද නවා
පවු කළ ගොනෝ ඇදපන් හපුතල් ය නවා

මේ කවෙන් පෙනී යන්නේ කරත්ත රැකියාවද ගැමියන් තුළ තිබූ බවයි. එමෙන්ම ඔරු පාරු පැදීම රැකියාවක් කොට ගත් තොටියාද ජීවිතය පරදුවට තබා ගැඹුරු පතල්වල වැඩ කළ පතල්කරුද අනෙක් එවැනිම කර්මාන්ත කරන කම්කරුවන්ටද හිමි වූ ජනකවි රැසක් වෙයි. සිංහලයාගේ කර්මාන්තයන්ගේ සංස්කෘතියෙහිද නොනැසෙන අංගයක්වා ජන කවිය පැවති බව මේ කවිවලින් ඔප්පු වේ. කවිය ගැමි ජීවිතයට කෙතරම් ළංවූයේද යත්, කවියකින් තොරව රැකියාවද කිරීමට ඔවුන්ට නොහැකි විය. ගොයම් කවි ආදිය නිදසුන්ය.

විනෝදය සඳහා තම තමන්ම සුදුසු ක්‍රීඩාවන්හි යෙදීම සිංහල ජීවිතයෙහි එක් අංගයකි. ලී කෙළිය, මේවර කෙළිය, එළුවන් කෙළිය මේ අතරට වැටෙන ක්‍රීඩාවන්ය. මෙයට නිදසුනක් ලෙස පහත සඳහන් කවිය ගෙන බලමු.

එක ගසකින් ලී හයක් කපා ගෙන
එක උස ඇති හංදනෙක් ගෙන්නා ගෙන
ගුරුන් අතට දී අවසර අර ගෙන
ඉතින් කෙළිමු ලී දෙපිල බෙදී ගෙන

මෙයින් පෙනී යන්නේ ක්‍රීඩාවන් පිළිබඳවය.

නූතන සමාජයට වඩා ගැමියෝ පන්සල් ඇසුරු කළහ. පන්සල්වල හිමිවරුන්ගෙන් අකුරු උගත්හ. මෙසේ පන්සලකින් අකුරු උගත් තරුණියකට ඇයට ගමේ මිනිසුන් නොයෙක් අවලාද කථා කීම නිසා ඇය තමාගේ ගුරුවරයාට පහත සඳහන් කවිය ලියා ශෝකය ප්‍රකාශ කර ඇති බව පෙනේ.

සැසී බසය සසගය දුක අපි ය ත්තේ
රිසි අය වියෝවීමද දුක ව ත්තේ
වසී ඉඳින රම බල අප අහි ත ත්තේ
දැසී ඉන් සමිඳු දැකුමට නැත එ ත්තේ

මෙවැනි බොහෝ කවි ලියැවී ඇති බව පෙනේ. සුරතලයට හැදූ තලගොයි පැටියෙකුගේ වියෝ වීම නිසා අයිතිකරු කියූ කවියත් — වන මම් බාලේ ආදී වශයෙන් පටන් ගැනෙන කවියද මෙවැනි ගණයට අයත් කවියකි.

සෑම අංශයක මෙන්ම තරුණ තරුණියන් ඔවුන්ගේ අදහස ප්‍රකාශ කිරීමටද කවිය උපයෝගී කරගෙන ඇති බව පෙනේ. එක්තරා තරුණ තරුණියන් දෙදෙනෙකු පෙමින් බැඳී සිටි තරුණයා තරුණිය අමතා කියූ කවියක් පහත සඳහන් වේ.

පුත් සදේ ලවන තොකියත් හැම　　දාම
රත් බදේ ඉසින ගෝමර පෙති　　සේම
මම් ලදේ මෙදුක ඉවසන්නේ කො　　හොම
යත් ළදේ රටක කාටත් නොකි　　යාම

මෙවැනිම තවත් කවියක් ගෙන බලමු. මේ කවියේ අදහස් වන්නේ තරුණයකු හා තරුණියක පෙමින් බැඳී සිටීමයි. එසේ වුවත් තරුණියට අන් තරුණයකු හා දීග යෑමට සිදු විය. ඉන්පසු පෙරකී තරුණයා දිනක් රූ බෝ වීම නිසා ඇයගේ නිවසට ගොස් නවාතැන් ගත් කල ඒ දෙදෙනා අතර ඇතිවූ දෙබස පහත සඳහන් කවි දෙකෙන් පැහැදිලිය.

ආදි අපි දෙන්න දිය පිට මලක්　　වගේ
දැනට අපි දෙන්නා දිවි දුටු මුවන්　　වගේ
ගොඩ තුපුරුදු දිය තුපුරුදු සතුන්　　වගේ
උඹලගේ සෙනේ හුණු නැති බුලත් විට　　-වගේ

එම කවිය ඇසූ තරුණිය පහත සඳහන් කවියෙන් පිළිතුරු දී ඇති බව පෙනේ.

ආදි අපි දෙන්න දෙන්නම තමු　　න්නේ
දැනට අපි දෙන්න දෙන්නම අනු　　න්නේ
නොදැන නොවෙයි පිල පිට පැදුර දු　　න්නේ
යතුර මෙන්න මේ ගේ දොර　　අරින්නේ

මේ දෙබසින් අපට පෙනෙන්නේ කවිය ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව දෙපක්ෂයටම පොදු වස්තුවක් බවයි.

ජනකවියෙන් පිළිඹිබුවන පොදුජන ඇදහිලි අතර දෙවියන් වැඳීම ගැමියන් ඉතා උසස් ලෙස සැලකූ බව පෙනේ. ඔවුන් යම් කිසි දෙයක් කිරීමට පෙර දෙවියන් වැඳීම කළ බව පැහැදිලි වේ. පහත සඳහන් කවියෙන් පැහැදිලි වන්නේ ක්‍රීඩාවක් පිළිබඳව වුවද එය කිරීමේදී දෙවියන්ගේ ආරක්ෂාව පැතූ බවයි. මෙය පොර පොල් ගැසීම පිළිබඳව කවියකි.

වැඳ දෙවියන් හට වරම් ලැබෙ　　නවා
උඩු පිළියේ පොල් බිඳී තිය　　නවා
තෙදම්ණි සලබෙන් පවන් සැලෙ　　නවා
පොල් කෙළියට නැත වස් දුරු වෙ　　නවා

මෙසේ අං ඇදීමද එක් ක්‍රීඩාවක්ව පැවති බව පෙනේ. මෙය නූතන සමාජයේද ගැමි ප්‍රදේශවල දක්නට ලැබෙන ක්‍රීඩාවකි. මෙම කවියෙන් පත්තිනි දේවිය ඇදහූ බව කියවේ. පහත සඳහන් වන්නේ කවියයි.

තොයවා වැඩියයි මල් ආසන　　යට
සෙල්ලන් සිරිතට පිහිටයි අප　　හට
පේකර අං තිබ්බා ඔබ තා　　මෙට
මල් පත්තිනි දෙවියන් වැඩියයි අං කෙළි　　යට

මෙවැනිම අප දන්නා කවියක් ගෙන බලමු. මෙයද පත්තිනි දේවිය උදෙසා ඇගෙන් පිහිට පතා ඇති බව පහත සඳහන් කවියෙන් පැහැදිලි වේ.

ඉරබාරයි ඉරවට යන ගිරවු　　න්ට
සඳබාරයි සඳවට යන සාවු　　න්ට
මල බාරයි මලවට යන බමරු　　න්ට
අපි බාරයි සත් පත්තිනි දෙවිය　　න්ට

මේ සෑම කවියකින්ම පෙනී යන්නේ සිංහල ගැමි ජීවිතයේ පොදු ජන ඇදහිලි අතර දේව ඇදහිල්ලද තිබූ බවයි. කලාකාරයක් තිස්සේ දෙවි දේවතාවුන් විශ්වාසයෙන් සිටි සිංහලයන්ට තමන්ගේ සෑම කාර්යකදීම දෙවියන් සිහි වීම සාමාන්‍ය කරුණකි. ගොවිතැන් කටයුතු සාර්ථකව රැද පවතින්නෙ ස්වභාව ධර්මයෙන් ලැබෙන පිහිට මතය. නිසි කලට වැසිදිය නොලැබුණහොත් ගොවිතැන් කටයුතු සාර්ථක කරගැනීමට උගහටය. අසීරුය. නියගය, වර්ෂාව, සුළිසුළං ආදි ස්වභාව ධර්මයේ හාස්කම් ගොවියාට පාලනය කළ නොහැකි විය. ඔවුන්ට

දෙවියන්ගේ පිහිට පැතීමට සිදුවූයේ එහෙයිනි. ස්වභාව ධර්මයෙන් බැට කන ගොවියා දෙවියන්ට කන්තලව් කළේ හෝක්කාඩුවක් කියන්නාක් මෙනි. පහත සඳහන් කවිය විමසා බලන විට අපට පෙනේ.

වතුර වැසි නැතිව රට ගිනි ඇවිලි — ච්චි
වපුල ගොඩ බෝග කුරහන් මැරී — ච්චි
කතරගම දෙවිගෙ දිවසට නොපෙනෙ — ච්චි
තපුරු කලක් අපහට දැන් පැමිණෙ — ච්චි

ඇතැම් විට බලාපොරොත්තු කඩවීම නිසා මිනිසුන්ගේ ඇතැම් පදවලට පමණක් නොව පරිභවයටද දෙවියන් ලක්වූ බව ලක්දිව පිළිබඳ පොතක් ලියූ රොබට් නොක්ස් නම් කතුවරයා තම කෘතියේ 219 වන පිටේ මෙසේ සඳහන් කරයි. 'මොවුන් දෙවියන් තමන් ඉදිරියේ සිටින්නා සේ යදිති. පුදති. කන්තලව් කරති. එනම් නියම බාරය ඔප්පු කිරීමට ප්‍රතිඥාව භාරගත් දෙවි තෙමේ තමාගේ යුතුකම වූ පරිදි යදින්නාගේ මන දොළ සපුරා විපතට පත් තැනැත්තා සැපතෙහි පිහිටුවා ලිය යුතුය. ඉදින් දෙවියන් ප්‍රතිඥාව භංග කළහොත් භාර ඔප්පු කරණු වෙනුවට තිත්ත කථාවෙන් බැනුම් ඇසීමට සිදු වේ. දෙවියන් අප මුලා කළා හූ යැයි ගම් වැසියෝ දෙවියන්ට සාප කරති. තමන් විසින් යදින ලද කාරිය කිරීමට අපොහොසත් වූවහොත් 'ඌ මොන දෙවියෙක්ද ඌට පූජා තියනවාට වඩා හොඳයි කටේ පහරණවා' යැයි අශිෂ්ට ලෙස බැන වදිති. මෙසේ මෙවැනි කෘතිවලින්ද පෙන්වා දෙන්නේ ගැමි ජීවිතය පිළිබඳවයි.

මෙම කවි ලිවීම, කියවීම ගිහියන් පමණක් ප්‍රිය කළ බව පෙනේ

සකල මුවතඹර සියොගත සිවු මැලි — යේ
අසලක නම් දැක දැක ඉන්නට පිරි — යේ
ඇසල මස දිටිමි යනවා දෙව් කෙළි — යේ
සකල සිරි ලකට අගරජ තුඹද ලි — යේ

මෙම කවිය රාජගුරු මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් විසින් කියන ලද්දක් බව පෙනේ.

ජනකවියේ ඇති ඉතා වටිනා අංගය නම් අවස්ථා නිරූපනය හා ඊට සුදුසු පදමාලාවද විරිතද යොදා සකස් කිරීමයි. ප්‍රේමය, ශෝකය, උපහාස, දුක, සන්තාපය මැදිහත් බව ආදි සෑම අංගයක්ම ජනකවියෙන් විවරණය වී ඇති බව කිව යුතුය. උපදේශය හා අවවාදය ජන කවියට නැගුණු බවත් එය දැනමිති කම් සඳහා භාවිතා වූ බවත් පෙනේ. පහත සඳහන් වන්නේ උපදේශාත්මක කවියකි.

මල් පිපුණත් ගති නැරෙයි කොඹ — රුකේ
සිල් ගත්තත් බළලට බයලූ මු — සිකේ
කල් තැබුමුත් බලූ වලිගය උණ පු — රුකේ
සොල්පයකුත් ඇද යන්නේ නැත — ඒකේ

සිංහල ජීවිතය හැඩ ගැසීමෙහිලා කොතරම් දුරට බලපා ඇද්ද යනු මේ උදාහරණ පිංවෙන් පෙනේ. එපමණක් නොවේ. ගැමියා ඉපදුණු දින පටන් මැරෙන මොහොත දක්වාම කවිය ඇසුරු කළ බව පෙනේ. මැරුණු පසුද මිනිය ළඟ සිට කවි කී බවයි.

ජනකවිය ගැන සංයුක්ත අටුවාවෙහි සඳහන් වේ. මෙසේ එහි සඳහන් වන්නේ කවි ඇසූ රහතන් වහන්සේලා 60 නමක් රහත්වූ බව පෙන්වීම සඳහාය. එය මෙසේය.

සිහල දීපෙ මග්ග පසෙස සස්සං රක්ඛන්තියා සීහ වෙට්කාය සීහල කෙනෙව ජාති ජරා මරණ පටිසංයුත්තං ගීතං ගායන්තියා සුත්වා මගගං ගච්ඡන්තා සට්ටි මත්තා පිපස්සක භික්ඛු අරහත්තං පත්තා

මෙය අනුරාධපුරයේ ලියවිණ මේ සෑම දෙයකින්ම පෙනී යන්නේ ජනකවි ඉතා පැරණි දෙවල් බවත් ඒවා මිනිසුන් හා සම්බන්ධව තිබූ බවත්ය.

සිංහල ජීවිතය සංකීර්ණ නොවූ සරළ සැහැල්ලු ජීවිතයෙහි සිංහල ජනකවිය ඊට අනුරූප වන සේ සරල බසින්ද අසංකීර්ණ වින්නාවෙන්ද සැදී ඇති බව පෙනේ. කාලය හා දේශය යන දෙදෙනා විසින් බොහෝ කලක් සිට හික්මවන ලදුව හොඳින් හැදුණු සමාජයක අංගයක් ලෙස ගත යුතු අතර අංග රැසක් මේ කවි සමූහය තුළ රැඳී පවතී. එමෙන්ම සිංහල ඉතිහාසය යම් පමණ ඈතට දිවේ නම් ජන කවියේ ඉතිහාසයද එපමණ ඈත සිට එන සේ පෙන්වා දිය හැකිය. එමෙන්ම මේ සෑම ජනකවියකින්ම පිළිඹිබු කරන්නේ ගැමි ජීවිතයයි.

---


ආශ්‍රිත ග්‍රන්ථ

1. ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්‍ෂණ
   (මාහාචාර්ය මිනිවන් පී. තිලකරත්න මහතා)
2. සාහිත්‍ය ත්‍රෛමාසිකය 1968.